# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 379/9 — 1985 දෙසැම්බර් 10 වැනි අඟහරුවාදා — 1985.12.10

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්. බී.—වී. 21/78.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වන වගන්තිය සමඟ කියවිය යුතු 140 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියමාවලිය.

ආචාර්ය බී. එස් විජේවීර,
ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1985 දෙසැම්බර් මස 10 වන දින,
කොළඹ දීය.

නියමාවලිය

1. 1980 අප්‍රේල් මස 10 වන දින අංක 83/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1980 අංක 1 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය මෙහි පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 7 වන ඡේදයේ (6) වන හා (7) වන අනුඡේද දෙකෙහි "එසේ වැඩ පිළිවෙලක් යොදනු කෙතේ විශ්ව විද්‍යාලයේ ලේඛකාධිකාරිවරයා විසින් ඒ ධුරයේ එදිනෙදා කාර්ය කර ගෙන යා යුතුය" යන වචන අත්හැරීමෙන්,

(2) එහි 10 වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"10. (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලය ආයතනයේ අධ්‍යයන හා විධායක මණ්ඩලය වන අතර, එය—

(1) පහත සඳහන් නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගෙන් එනම්,

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;

(ඇ) සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;

(ඈ) ශික්ෂණ රෝහල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;

(ඉ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;

(ඊ) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(උ) ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරයා ;

(ඌ) වෛද්‍ය සේවා විෂයය භාර නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා ;

(එ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨාධිපති ;

(ඒ) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨාධිපති ;

(ඔ) ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨාධිපති ;

(ඕ) ශ්‍රී ලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨාධිපති ;

(2) පහත සඳහන් අනික් සාමාජිකයන්ගෙන් එනම්—

(අ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් ඒ පීඨයේ අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් තෝරා පත් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

(ආ) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් ඒ පීඨයේ අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් තෝරා පත් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඇ) ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් ඒ පීඨයේ අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් තෝරා පත් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඈ) ශ්‍රී ලංකාවේ රුහුණු විශ්වවිද්‍යාලයයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් ඒ පීඨයේ අධ්‍යයන අංශ ප්‍රධානීන් අතුරින් තෝරා පත් කරනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඉ) අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි, වෘත්තීය ක්ෂේත්‍රයෙහි, විද්‍යා ක්ෂේත්‍රයෙහි හෝ පරිපාලන ක්ෂේත්‍රයෙහි විශිෂ්ට සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතුරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් අට දෙනෙක් ;

එසේ වුවද, එසේ පත් කරනු ලැබූ සාමාජිකයන් අතුරින් යටත් පිරිසෙයින් පස් දෙනෙකුවත් වෛද්‍ය වෘත්තියට අයත් තැනැත්තන් විය යුතුය.

(3) එහි 11 වන ඡේදයෙහි—

(i) (6) වන අනුඡේදයේ "යම් පත් කරනු ලැබූ සාමාජිකයකු" යන වචන වෙනුවට "යම් තෝරා පත් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමාජිකයකු" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ii) (7) වන අනු ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(7) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් හෝ දීමනා මණ්ඩලයේ සාමාජිකයින්ට ගෙවනු ලැබිය යුතුය."

(4) එහි 13 වන ඡේදයේ

(ඹ) අනු ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අනුඡේද ඇතුළත් කිරීමෙන් :—

"(ක) අධිකරණ වෛද්‍ය විද්‍යාව ;

(ග) ක්ෂුද්‍ර ජෛවවේදය ;

(ච) කණ්ඨ ස්වරාලවේදය ; සහ

(ජ) විකිරණ චිකිත්සාව හා නියෝප්ලාස්මවේදය." ;

(5) එහි 14 වන ඡේදයෙහි—

"(1) (1), (2) සහ (3) වන අනුඡේද ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

"(1) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල එකක හෝ ඊට වැඩි ගණනක අධ්‍යයන අංශයක් පිහිටුවා ඇත්තා වූ විශේෂ ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් අධ්‍යයන සභාවක් පිහිටුවා ඇති අවස්ථාවක, ඒ අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුය :—

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) උචිත වෘත්තීය මණ්ඩලය විසින් එම වෘත්තීය මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් හය දෙනෙක් ;

(ඇ) ශ්‍රී ලංකාවේ වෛද්‍ය පීඨයක් ඇති එක් එක් විශ්වවිද්‍යාලයක අධ්‍යයන අංශයේ ප්‍රධානයා ;

(ඈ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් එම පීඨයට අයත් මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඉ) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් එම පීඨයට අයත් මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඊ) ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් එම පීඨයට අයත් මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක්, සහ

(උ) ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් එම පීඨයට අයත් මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක්.

(2) ශ්‍රී ලංකාවේ කිසිම විශ්වවිද්‍යාලයක් විසින් අධ්‍යයන අංශයක් පිහිටුවනු ලැබ නොමැති විශේෂ ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් අධ්‍යයන සභාවක් පිහිටුවා ඇති අවස්ථාවක, ඒ අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතුයි :—

(අ) අධ්‍යක්ෂවරයා ;

(ආ) උචිත වෘත්තීය මණ්ඩලය විසින් ඒ වෘත්තීය මණ්ඩලයේ සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් පස් දෙනෙක් ;

(ඇ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් ඒ පීඨයේ මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඈ) ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් ඒ පීඨයේ මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක් ;

(ඉ) ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් ඒ පීඨයේ මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක් ; සහ

(ඊ) ශ්‍රී ලංකාවේ රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලය විසින් ඒ පීඨයේ මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන එක් සාමාජිකයෙක්."

(2) 7 වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් —

"(7) එක් එක් අධ්‍යයන සභාවට උචිත අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය මත, ඒ අධ්‍යයන සභාව විසින් පත් කරනු ලබන ලේකම්වරයකු සිටිය යුතුය." ;

(6) එහි 24 වන ඡේදයෙහි—

(1) (2) වන අනුඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් —

" (2) පනත යටතේ ස්ථාපනය කරන ලද්දා වූ හෝ ස්ථාපනය කරන ලදැයි සලකනු ලබන යම් විශ්වවිද්‍යාලයක් විසින් 13 වන ඡේදයේ විධිවිධාන යටතේ ආයතනය විසින් යම් අධ්‍යයන සභාවක් පිහිටුවනු ලැබ නොමැති, වෛද්‍ය විද්‍යාවේ යම් විශේෂ ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම හා පිරිනැමීම කළ හැකිය ;

(3 පනත යටතේ ස්ථාපනය කරන ලද්දා වූ හෝ ස්ථාපනය කරන ලදැයි සලකනු ලබන්නා වූ යම් විශ්ව විද්‍යාලයක් විසින් 13 වන ඡේදයේ විධිවිධාන යටතේ ආයතනය විසින් වෛද්‍ය විද්‍යාවේ යම් විශේෂ ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් අධ්‍යයන සභාවක් ස්ථාපනය කර තිබුණද, නොතිබුණද, ඒ විශේෂ ක්ෂේත්‍රයෙහි ලා පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් කරන ලද පර්යේෂණ මත, පදනම් වූ පශ්චාත් උපාධි ප්‍රදානය කිරීම හා පිරිනැමීම කරනු ලැබිය හැකිය ; තවද ";

(2) (3) වන අනුඡේදය (4) වන අනුඡේදය වශයෙන් නැවත අංක යෙදීමෙන් ; සහ

(7) 25 වන ඡේදයෙහි " වෛද්‍ය විද්‍යාවේ විශේෂ ක්ෂේත්‍රය " යන යෙදුමේ අර්ථ කථනය වෙනුවට පහත දක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :

" වෛද්‍ය විද්‍යාවේ විශේෂ ක්ෂේත්‍රය " යන්නෙන් නිර්වින්දවේදය, ප්‍රජා වෛද්‍ය විද්‍යාව, පවුල් වෛද්‍ය විද්‍යාව සහ සාමාන්‍ය වෛද්‍ය වෘත්තිය, වෛද්‍ය විද්‍යාව, ධාත්‍රී ශාස්ත්‍රය හා නාරිවේදය, අක්ෂිවේදය, ව්‍යාධිවේදය, කෞමාරභෘත්‍යය, මනෝ වෛද්‍ය විද්‍යාව, විකිරණ වේදය, ශල්‍ය වෛද්‍ය විද්‍යාව, අධිකරණ වෛද්‍ය විද්‍යාව, ක්ෂුද්‍රජෛවවේදය, කණ්ඨස්වරාලවේදය, විකිරණ චිකිත්සාව සහ නියෝප්ලාස්ම වේදය හෝ ආයතනයේ සහ විශ්ව විද්‍යාලයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ යම් විශේෂ ක්ෂේත්‍රයක් අදහස් වේ.

12-529

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.